# පුළුටු මැටි රූප නිර්මාණ තාක්ෂණය

**කේ.එම්. අනිල් සුරේෂ් කුමාර**
කැනීම් හා පර්යේෂණ අංශය, අභයගිරි විහාර ව්‍යාපෘතිය,
මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.
*anilsureshkumaranew@gmail.com*

ප්‍රමුඛපදඃ පුළුටු මැටි රූප, ටෙරාකොටා, තාක්ෂණය, සීගිරිය

**හැඳින්වීම**

පුළුටු මැටි රූප හෙවත් ටෙරාකොටා ගැමි ජන සංස්කෘතියක් නියෝජනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ වියළි කලාපය ආශ්‍රිත හමු වේ. කෘෂිකාර්මික ජීවිතයක් ගතකළ මිනිසුන් නොයෙක් ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන පුළුටු මැටි රූප නිර්මාණය කර ඇත. මෙම මැටි රූප ග්‍රාම්‍ය කලාවක් නිරූපණය කරන අතර මැටියෙන් තනා පුළුස්සා ගෙන ඇති බැවින් මැටි රූප, ටෙරාකොටා රූප, පුළුටු මැටි රූප වැනි නම් වලින් ප්‍රකටයි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පාරිභාෂිතය සඳහා මෙම රූපකලාව හැඳින්වීමට ප්‍රිශාන්ත ගුණවර්ධන විසින් පුළුටු මැටිරූප යන වචනය හඳුන්වා දෙන ලදී (ගුණවර්ධන, 1994:12).

ටෙරාකොටා නිර්මාණය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එයට විශාල ව්‍යාප්තියක් හිමි බව හඳුනා ගත හැක. විශේෂයෙන් ම වියළි කලාප තුළ ඉනාමළුව, රොටවැව, තබ්බෝව, මරදන්මඩුව, ගල්කැටිදමන, කිළිනොච්චිය, ඇළහැර, රාජාංගනය ආදීස්ථාන 41 පමණ ටෙරාකොටා පිළිබඳ සාධක ලැබී ඇත. මානව රූපී නිර්මාණ සහ මානව රූපී නොවන නිර්මාණ හමු වී තිබේ. ලිංග රූප, මිනිස් උඩුකය රූප, කවන්ධ රූප, අත් පා වැනි ශරීර කොටස් මානව රූපී මූර්තීන් අතරට වේ. මානව රූපි නොවන සත්ත්ව රූප සහ හඳුනාගත නොහැකි ටෙරාකොටා නිර්මාණ ද ලැබී ඇත. පුළුටු මැටි රූප හෙවත් ටෙරාකොටා රූප කලාවේ කාලවකවානු පිළිබඳ ව විවිධ අදහස් පවතී. මේවා හමු වී ඇති ප්‍රදේශ සියල්ල ම වාගේ දිවයිනේ උතුරු දිග තැනිතලාවට හා ඊට ආසන්න ප්‍රදේශ වේ. එබැවින් මෙම රූප කලාව වියළි කලාපීය සංස්කෘතියක් බවට සැකයක් නැත. සීගිරිය, අලකොළවැව රූප ක්‍රිස්තු වර්ෂ 3-5 සියවස් අතරටත්, මානාවැව හා උතුරු දොරටුව අවටින් හමු වූ රූප 13-18 අතරටත් කාලනිර්ණය කර ඇත (දොඩම්වල 1998, පි.6). තබ්බෝව-මරදන්මඩුව රූප ක්‍රි.පූ. 300-ක්‍රි.ව.200 අතරටත්, නිර්මාණ සහ මානව රූපී නොවන නිර්මාණ හමු වී තිබේ. ලිංග රූප, මිනිස් උඩුකය රූප, කවන්ධරූප, අත් පා වැනි ශරීරකොටස් මානවරූපි

මූර්තීන් අතරට වේ. සත්ත්ව රූපසහ හඳුනාගත නොහැකි ටෙරාකොටා නිර්මාණ ද ලැබී ඇත. පුළුටු මැටි රූප හෙවත් ටෙරාකොටා රූප කලාවේ කාලවකවානු පිළිබඳ ව විවිධ අදහස් පවතී. මේවා හමු වී ඇති ප්‍රදේශ සියල්ල ම පාහේ දිවයිනේ උතුරු දිග තැනිතලාවට හා ඊට ආසන්න ප්‍රදේශ වේ. එබැවින් මෙම රූප කලාව වියළි කලාපීය සංස්කෘතිකාංගයක් බවට සැකයක් නැත. සීගිරිය-අලකොළවැව රූප ක්‍රිස්තු වර්ෂ 3-5 සියවස් අතරටත්, මානාවැව හා උතුරු දොරටුව අවටින් හමු වූ රූප ක්‍රිස්තු වර්ෂ 13-18 සියවස් අතරටත් කාලනිර්ණය කර ඇත (දොඩම්වල 1998:6). තබ්බෝව-මරදන්මඩුව රූප ක්‍රිස්තු පූර්ව 300-ක්‍රිස්තු වර්ෂ 200 අතරටත්, (Deraniyagala 1961: 258) මෙවැනි රූප සම්බන්ධයෙන් විධිමත් කැනීම් බිමක් වූ රන්දෙණිගමෙන් හමු වූ රූප ක්‍රිස්තු වර්ෂ 370-1275 අතරටත් කාලනිර්ණය කරඇත්තේ ය (Deraniyagala, 1997:33). ඒ අනුව ක්‍රිස්තු වර්ෂ තුන් වැනි සියවස පමණ සිට දහ තුන්වන සියවස දක්වා මෙම සංස්කෘතිය අඛණ්ඩ ව පැවත ඇතිබව පෙනෙයි.

## ක්‍රමවේදය

පොළොන්නරුව කෞතුකාගාරය සතුව ඇති පුළුටු මැටිරූප අධ්‍යයනය කරන ලද අතර අනතුරු ව ශ්‍රී ලංකාවෙන් මෙතෙක් හමු වී ඇති පුළුටු මැටි රූප සම්බන්ධයෙන් පහළ වී ඇති අදහස් සහ නිගමනයන් පිළිබඳ සොයාබලන ලදී. ග්‍රන්ථ පරිශීලනය කිරීම, සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගැනීම හා දත්ත විශ්ලේෂණ සිදුකිරීම.

## ප්‍රතිඵල හාසාකච්ඡාව

මැටිවිවිධ නිර්මාණ සඳහා උපයෝගී කරගත හැකි බව ප්‍රාථමික මිනිසා විසින් වටහා ගන්නට ඇත්තේ අහම්බෙන් මෙන් විය යුතු ය. පරිසරයේ තිබෙන දෑ පරිහරණයට ගැනීමට හෝ ඒවා පරාජය කිරීමට ඔහු එය අවශ්‍යතාව නිසාම කළායැයි කියනවාට වඩා එසේ කරන්නට සිදු වුවා යැයි කීම උචිතය. ඔහු විසින් ලැබූ ඇතැම් ජයග්‍රහණ අහම්බෙන් සිදු වූ ඒවා ය. දීර්ඝ කාලයක් තිස්සේ තම අත්දැකීම්වලට ලක් වූ දෑ ප්‍රත්‍යක්ෂයෙන් දැනහැඳින ගත්තේය (ජයතිලක 1983:74). මානව ඉතිහාසය තුළ මැටි තරම් පහසුවෙන් ලබාගත හැකි හා පහසුවෙන් හැසිරවිය හැකි අමුද්‍රව්‍යක් නැති තරම් ය.

ලෝකයේ ශිෂ්ටාචාර දෙස බැලීමේ දී මානවයා පිළිබඳ නොයෙක් සාදක හමු වී ඇත. ගංගාදාරවල ගංවතුර නිසා තැන්පත් වන රොන්මඩ අව් රශ්මියෙන් වියළී ඉරිතලා විවිධ හැඩයේ ගඩොළු වැනි නිර්මාණයන් ඇතිවනු දුටු නයිල්, යුප්‍රටීස් හා ටයිග්‍රීස්මිනිසා ඒවාඉතා පරිස්සමින් ගලවාගෙන මනා හැඩයකින් යුතු ව නිර්මාණය කොට ගොඩනැගිලි සැකසීම සඳහා යොදාගෙන ඇත. මානවයා මේ තුළින් අත්දැකීම් ලබාගෙන මැටි මඟින් යම් නිර්මාණ කළ හැකි බවත්, යම්කිසි හැඩයක් තනා ගැනීමෙන් පසු අව්වේ වියළිය

යුතු බව ද අවබෝධ කරගෙන ඇත. මානවයා ගින්දර සොයා ගැනීමෙන් පසු ආහාර පුළුස්සා ගැනීමට හා මැටි මෙවලම් පුළුස්සා ගැනීමට ද පුරුදුවන්නට ඇත. බ්‍රසීලියානු වෙරළබඩ ස්වදේශික ගෝත්‍රික මිනිස් කොට්ටාසයක් තමන් විසින් භාවිතයට ගනු ලබන භාජන සෑදීමකර ඇත්තේ පළමු ව සාදන ලද ලී සැකිල්ල මත මැටි තැවරීමෙනි. ගිනි මත තබා රත්කිරීමේ දී ලී සැකිල්ල ඉවත්ව ගොස් ''මැටි හැඩය'' පමණක් ඉතිරි වේ. මෙම ක්‍රමය මැටි පිළිස්සීමෙන් පසු ලබාගන්නා ශක්තිය ප්‍රාථමික මිනිසා විසින් වටහා ගත් එක් ආකාරයක් සඳහා කදිම නිදසුනකි. ප්‍රංශ නාවිකයකුගේ ගවේෂණයකින් ලැබුණු එම තොරතුරුත්, ජර්මන් ජාතික ගවේෂකයෙකුගේ ගවේෂණයක ප්‍රතිඵලත් මෙම අදහස තවදුරටත් තහවුරු කරයි (Neuburgor 1930:130).

දැව, ශෛලමය, ලෝහ හා වෙනත් දෑ නිර්මාණයන් සඳහා යොදා ගනු ලබන තාක්ෂණික ශිල්ප සේ මැටි මාධ්‍යයට ද ආවේණික වූ තාක්ෂණික ක්‍රමවේදයක් ඇත. සුදුසු මැටි වර්ග සොයා ගෙන මැටිපදම් කිරීමෙන් පසුව අවශ්‍ය භාණ්ඩය හෝ උපකරණය සකපෝරුව හා අච්චුවක් භාවිතයෙන් නිර්මාණය කරනු ලබන අතර පසුව වියළීමෙන් අනතුරු ව පෝරණුවක දමා පිළිස්සීමට ලක්කිරීමෙන් සරල ව ටෙරාකොටා නිර්මාණය කරගත හැකි ය. ජන ඇදහිලි සම්බන්ධ ස්ත්‍රී, පුරුෂ, සත්ත්ව ආදී මූර්තිවල තාක්ෂණය පිළිබඳ ව පමණක් මෙහි දී අවධානය යොමු කරනු ලැබේ.

ස්ත්‍රී මූර්ති දෙස බැලීමේ දී සණව මූර්ති නිර්මාණය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර ඇත. කලාත්මක බව හා සමතුලිත බවින් තොර ව මනුෂ්‍ය රූප යැයි හඳුනා ගත නොහැකි තරමට විකෘති කර ඇත. මැට්ට තෙත් ව තිබිය දී ඇඟිලිවලින් තෙරපීම මඟින් මිනිස් සිරුරේ දළහැඩය තනා ඇති අතර පා, අත්, හිස ආදී අවයව වෙන්වෙන් ව තනා ප්‍රධාන මූර්ති කොටසට සවිකර තිබේ. ඇතැම් මූර්තියක මුහුණේ අවයව ද තෙරපීම මඟින් ම නිමවා ඇති බවක් ද දක්නට ලැබේ. දෙපස මැට්ට තෙරපීමෙන් නාසය ද සුළැඟිල්ල මඟින් ම නිමවා තිබෙනු දැකගත හැක. දෑස ද සුළැඟිල්ල මඟින් එබුම් සලකුණකින් දක්වා තිබේ. මුව කැපුම් සලකුණකින් නිර්මාණය කොට ඇත. ඇතැම් ටෙරාකොටා මූර්ති තුනී මැටි තීරුහෝ මැටි බෝල මූර්ති මත ඇලවීමෙන් කන්, නාසය, මුඛය, ඇස්, ඇහිබැමහා පියයුරු නිර්මාණය කොට ඇත. තෙත මැට්ට මත තිය තුඩින් කඩතොලු කිරීම ද දෑස් නිමවීම සඳහා යොදාගත් විකල්ප ක්‍රමයක් වේ. මෙම නිර්මාණයන් දෙස බැලීමේ දී වෘත්තිමය මූර්ති ශිල්පීන් විසින් නොව තම අවශ්‍යතාව උදෙසා සාමාන්‍ය ජනයා විසින් ටෙරාකොටා මූර්ති නිර්මාණය කර ඇති බව පැහැදිලි වන කරුණකි. විවිධ අභිචාර උදෙසා ගම්වල සිටින යකැදුරන් ද මෙම ටෙරාකොටා මූර්ති නිර්මාණය කොට ඇත. සම්මත නීති රීති මුඛපරම්පරාගත හෝ ලිඛිත සාදක

ටෙරාකොටා මූර්ති නිර්මාණයන් පිළිබඳ ව හමු වී නොමැත. පළමු වැන්න තාක්ෂණය ඉතා සරල වන අතර කලාව පිළිබඳ ප්‍රවීණත්වයක් ඔවුන් තුළ දක්නට නොලැබීම ය. කිසියම් කාලපරිච්ඡේදයක් තුළ එක ම මොහොතක පැතිරුණු කලාවක් ලෙස යොදාගෙන තිබෙන තාක්ෂණය වැදගත් ය (ගුණවර්ධන 2015:48). පුරුෂ රූප නිර්මාණයට ස්ත්‍රී රූප නිර්මාණ තාක්ෂණය උපයෝගී කරගෙන ඇතිඅතර පුරුෂ ලිංග රතු-තැඹිලි පැහැයටවන අතර තාත්වික ව නිර්මාණය කර ඇත. පුරුෂ ලිංග නිසිලෙස පහසුවෙන් හඳුනාගත හැක්කේ ශිෂ්ණ මුණ්ඩය පැහැදිළි ව දක්වා තිබීම හේතුවෙනි.

අත් හා අලියා වැනි ටෙරාකොටා මූර්ති දෙස බැලීමේ දී ඇතුළත කුහරය සහිත ව වූ තාක්ෂණය උපයෝගි කරගෙන නිර්මාණය කර ඇත. ශුෂිර ක්‍රමය යනු මෙහි ප්‍රතිවිරුද්ධ වූ ශිල්පීය ක්‍රමයයි. ඇතුළත කුහරාකාර ව නිර්මාණය කිරීමේ මෙම ක්‍රමය ලංකාවේ ඈත අතීතයේ සිට ම භාවිත වූ බව පෙනේ. මේ සඳහා පුරාවිද්‍යාත්මක නිදර්ශන සමූහයක් ම වේ. ඉදිරිපත් කිරීමට අපෙක්ෂා කරන මූලික ලක්ෂණ බාහිර තලය ම ඒ ආකාරයෙන් ම රකිමින්, එහි ම මධ්‍යය කුහර සහිත ව නිර්මාණය කිරීම ස්වාභාවය ය (ජයතිලක 19838:5).

අත් කුහර සහිතව නිර්මාණය කරන්නට ඇත්තේ කිසියම් ආධාරයක රැඳවීම සඳහා විය හැකි ය. කෝටුවක් වැනි දෙයක් මත රඳවාගෙන අවශ්‍ය අභිචාරයන් සිදුකරන්නට ඇත. නමුත් ශුෂිර ක්‍රමය යොදා ගැනීමෙන් නිර්මාණය කිරීම නිසා ටෙරාකොටා මූර්තියේ ශක්තිය නැතහොත් කැඩීබිඳී යාම්වලට ඔරොත්තු දී මේ ශක්තිය අඩුවේ. ඝනත්වය අඩුනිසා වියළීමේ දී හා පිළිස්සීමේ දී සිදුවන පිපිරීම් හා ඉරිතැලීම් අඩු ය. පරිහරණය කිරීමේ දී වඩාත් පහසුවක් ශුෂිරක්‍රමය තුළ දක්නට ලැබේ. ජනඇදහිලි සම්බන්ධ ස්ත්‍රී, පුරුෂ, සත්ත්ව ආදී මූර්තිවල ඉතාමත් සරල තාක්ෂණයක් භාවිත කර ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජයතිලක, කේ. එච්. (1983) ලංකාවේ ටෙරාකොටා කර්මාන්තය, ශාස්ත්‍රපති උපාධිය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද නිබන්ධනය (අමුද්‍රිත)

Deraniyagala S.U.1972. The citadel of Anuradhapura (1969) Exavations in the Gedige Area, Ancient ceylon. No 2. Joulmal of the Archaeological Survey Department, Srilanka.

Neuburgor, A. 1930 .The Technical Arts and Science of the Ancients